**ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාව.**
**මහනුවර දිස්ත්‍රික්කය.**

---

## 1. මූල්‍ය ප්‍රකාශන.

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 26 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 අගෝස්තු 03 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය.

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම.

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයුර්වේද මධ්‍යස්ථානයේ තිබූ ඖෂධ තොගයේ වටිනාකම වූ රු. 215,160 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) කඳුරට උදානය ප්‍රතිපාදන යටතේ ඉටු නොකළ කර්මාන්ත 03 ක් වෙනුවෙන් 2013 වර්ෂයේ කර්මාන්ත ණයහිමි ප්‍රතිපාදන රු.1,500,000 ක් තවදුරටත් ගිණුම්වලින් ඉදිරියට ගෙනවිත් තිබුණි.

(ඇ) 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව, නැවත විකිණිය හැකි වත්කම් ලෙස නිර්දේශිත රු.126,949 ක එකතු වටිනාකමින්යුතු වත්කම් අයිතම 14 ක් හා විනාශ කළයුතු වත්කම් විෂයයන් 16 ක් වෙන්දේසි කිරීමට හෝ විනාශ කිරීමට කටයුතු නොකර, 2015 දෙසැම්බර් 31 දිනට ගිණුම්වලින් කපා හැර වෙන්දේසියේ විකිණිය හැකි භාණ්ඩ 2016 මැයි 05 දින වෙන්දේසි කර තිබුණි.

(ඈ) සභාව විසින් පාලනය කරනු ලබන සභාව සතු ක්‍රීඩා පිටි 02 ක සහ රථ ගාල් 02 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් යටතේ රු.25,000 ක වටිනාකමකින් යුතු සහිත සුසාන භූමි 17 ක් දක්වා තිබූ නමුත්, ඉදිරිපත් කරන ලද උපලේඛනය අනුව, සුසාන භූමි 21 ක් පැවතුණි.

(ඊ) පරිත්‍යාග ලෙස ලැබී තිබුණු අයිතිය පවරා ගැනීමට කටයුතු නොකළ රු.51,762,098 ක් වටිනා යන්ත්‍රෝපකරණ 03 ක් ගිණුම්කරණ සටහන් මගින් හෙළිදරව් කර දැක්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

**1.3.2 නොසැසඳුණු පාලන ගිණුම්**

**------------------------------**

ගිණුම් විෂයයන් 07 කට අදාළව ශේෂ පිරික්සුමේ සඳහන් ශේෂ හා ලෙජර් ගිණුම් ශේෂ අතර රු.188,894 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

**1.3.3 ලැබිය යුතු ගිණුම්**

**-------------------**

ලැබිය යුතුව තිබූ ගිණුම් ශේෂ 11 ක එකතු වටිනාකම රු.32,600,111 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂ එකතුව රු.17,301,017 ක් වී තිබුණි.

**1.3.4 ගෙවිය යුතු ගිණුම්**

**--------------------**

ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂ 02 ක එකතු වටිනාකම රු.21,419,776 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂවල එකතුව රු.19,180,135 ක් වී තිබුණි.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**-----------------------------------**

රු.85,675,041 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි 34 ක් සඳහා ඔප්පු හෝ පැවරුම් නියෝග විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**1.3.6 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

**---------------------------------------------------**

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය කරනු ලැබේ.

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 ප්‍රාදේශීය සභා පනත 19(xi, xii) උප වගන්ති | විෂයයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව සභාව සතු ගොඩනැගිල්ලක් වර්ෂ 30 ක කාල සීමාවක් සඳහා රු.20,000 ක මාසික කුළී මුදලකට මහජන බැංකුව වෙත බදු දී තිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති. 218 | සභාව සතු සියලු ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව පරීක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**---------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**-------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.18,127,661 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,728,674 ක් වුයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,398,987 ක වැඩිවීමක් දක්නට ලැබුණි.

## 2.2 ආදායම් පරිපාලනය

------------------------

### 2.2.1 ආදායම් රැස් කිරිමේ කාර්යය සාධනය

------------------------------------------

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2015.01.01 ට හිගය | වර්ෂයේ බිල් කළ ආදායම | එකතු කළ ආදායම | | | 2015.12.31 දිනට හිගය |
|---|---|---|---|---|---|---|
| | | | 2015 වර්ෂය තුළ හිගයෙන් එකතු කළ ආදායම | 2015 වර්ෂයේ බිල් කළ ආදායමෙන් එකතු කළ ආදායම | මුළු එකතුව | |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,756,578 | 908,565 | 568,473 | 468,793 | 967,412 | 1,627,877 |
| කුළී ආදායම් | 778,124 | 4,229,218 | 392,202 | 3,755,092 | 4,147,294 | 860,048 |
| බලපත්‍ර ගාස්තු | -- | 707,100 | -- | 707,100 | 707,100 | -- |
| වෙනත් ආදායම් | 2,226,543 | 11,679,007 | 319,633 | 1,176,829 | 1,496,462 | 12,409,158 |
| එකතුව | | | | | | 14,897,083 |

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.14,897,083 ක මුළු ආදායමක් හිග හිට තිබුණි.

### 2.2.2 වරිපනම් බදු

------------

පහත සදහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 ජනවාරි 01 දිනට හිග වරිපනම් බදු ශේෂය රු.1,692,370 ක් වූ අතර, 2015 දෙසැම්බර් 31 දින දක්වා බිල් කිරීම් රු.830,753 ක් විය. මින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අය කර තිබුණේ පිළිවෙළින් රු.566,505 ක් හා රු.383,436 ක් පමණි. මෙය ප්‍රතිශතයක් ලෙස සියයට 33 ක් හා සියයට 46 ක් විය.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට හිග වරිපනම් බදු ශේෂය තුළ වර්ෂ 01 ත් 22 ත් අතර කාලයක් තුළ වරිපනම් බදු ගෙවීම පැහැර හැර තිබූ බදුකරුවන් සංඛ්‍යාව 315 ක් වූ අතර, ඔවුන්ගෙන් රු.1,077,990 කට වඩා වැඩි මුදලක් සභාවට අය වියයුතුව තිබුණි. මේ සම්බන්ධයෙන් 1987 අංක 15 දරනප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය පරිදි කටයුතු කර නොතිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට අවුරුදු 02 ත් මාස 08 ත් අතර කාල පරාසයකට අදාළව රජයේ ආයතන 38 කින් අය වියයුතු හිග වරිපනම් බදු ශේෂය රු.241,770 ක් විය.

(ඈ) වසර 05 කට වරක් නව තක්සේරුවක් කර, බදු අය කළයුතු වුවත්, සභාව විසින් 2007 වර්ෂයෙන් පසු නව තක්සේරුවක් සිදු නොකර, පැරණි තක්සේරුව පදනම් කර ගනිමින් 2015 වර්ෂයට ද වරිපනම් බදු බිල් කර තිබුණි.

(ඉ) වරිපනම් බදු ගෙවීම පැහැර හැර තිබූ පුද්ගලයින් 68 දෙනෙකුට සමාලෝචිත වර්ෂයේ ජූලි හා අගෝස්තු මාසයන් හීදී රතු නිවේදන යවා තිබූ නමුත්, ඉන් 22 ක් මුදල් ගෙවා නොතිබුණි. ඔවුන් සම්බන්ධයෙන් කිසිදු ඉදිරි ක්‍රියාමාර්ගයක් සභාව විසින් ගෙන නොතිබුණි.

### 2.2.3 බදු කුළී

---------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු ඇත්ගාල වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 07 ක් නීත්‍යානුකූල ගිවිසුමකට එළඹීමකින් තොරව 2008 වර්ෂයේ දී බාහිර පාර්ශවයන්ට බදු දී තිබූ අතර, මෙම කඩ කාමරවලින් අය වියයුතු මූලික මුදල වූ රු.1,775,141 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම, මෙම වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 16 ක් වසා තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට අය වියයුතු කඩ කාමර කුළිය රු.860,048 ක් වූ අතර, මෙම හිග කඩ කාමර කුළී මාස 01 සිට වසර 09 දක්වා කාල පරාසයකට අදාළ විය. මෙම හිගයෙන් තවදුරටත් අය විය යුතුව තිබූ බව රු.566,941 ක් බව ලේකම්වරයා 2016 ජූලි 20 දාතමින් මා වෙත වාර්තා කර තිබුණි.

(ඇ) ඉහත හිග ශේෂය තුළ 2007 වර්ෂයට පෙර කුරුදුවත්ත නගරය සංවර්ධනයේ දී විනාශ වී හෝ කඩා ඉවත් කරන ලද කඩ කාමර 12 කින් අය වියයුතු රු.138,626 ක මුදලක් තිබූ අතර, මෙම මුදල් අය කර ගැනීමට හෝ සුදුස්සක් කිරීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ඈ) සභාව සතු අඩු ආදායම්ලාභීන් සඳහා ඉදි කර තිබූ කඩ කාමර 13 ක් ගිවිසුම්වලට එළඹීමකින් තොරව බදු දී තිබුණි.

(ඉ) 2016 මාර්තු 04 දින තක්සේරු දෙපාර්තමේන්තුව මගින් රු.15,000 ක මාසික තක්සේරු කුළියක් තීරණය කර තිබුණ ද, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

(ඊ) ප්‍රාදේශීය සභා පැරණි ගොඩනැගිල්ලට යාබදව ඇති ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පවත්වා ගෙන යනු ලබන වර්ග අඩි 1496 ක ප්‍රමාණයේ වූ ගොඩනැගිල්ල 2010 අගෝස්තු 26 දින පැවති මහා සභා තීරණය මත රු.1,000 ක මාසික කුළියකට වර්ෂ 02 ක කාලයකට බදු දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) ගොඩනැගිල්ල බදු දී 2016 ජූනි 15 දින වන විට වර්ෂ 05 ක කාලයක් ඉක්ම තිබුණද ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ii) අදාළ ආයතනයෙන් කිසිදු බදු කුළියක් අය කර ගෙන නොතිබූ අතර, 2015 දෙසැම්බර් 31 දින වන විට රු.63,000 ක කුළියක් අය වියයුතුව තිබුණි. මේ සම්බන්ධව සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි

### 2.2.4 අක්කර බදු.

------------

2015 ජනවාරි 01 දිනට හිග අක්කර බදු රු.64,208 ක් වූ අතර, 2015 දෙසැම්බර් 31 දින දක්වා බිල් කිරීම් රු.24,327 ක් විය. සමාලෝචිත වර්ෂයේ අවසන් දින වන විට අය කර තිබුණේ පිළිවෙළින් රු.1,968 ක් හා රු.15,502 ක් පමණි. මෙය ප්‍රතිශතයක් ලෙස සියයට 03 ක් හා සියයට 64 ක් විය. මේ අනුව අක්කර බදු

රැස් කිරීම දුර්වල මට්ටමක පැවතුණු අතර, මේ සම්බන්ධයෙන් 1987 අංක 15 ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.2.5 ඉඩම් බදු**

----------

කුරුදුවත්ත අංක 01 දරන බිම් කට්ටියේ බදුකරුගෙන් 2015 දෙසැම්බර් 31 දින වන විට හිග මුදල රු.114,665 ක් වූ අතර, මෙම මුදල වසර 03 කට ආසන්න කාලයක සිට හිගව පැවතුණ ද, ගිවිසුම පරිදි කටයුතු කර හිග මුදල් අය කර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම, බදු දෙනු ලැබූ ඉඩම පිළිබඳ විස්තර හා ඉඩමේ ප්‍රමාණය යනා දී තොරතුරු ගිවිසුම් පත්‍රයේ ඇතුළත් වී නොතිබුණි.

**2.2.6 ජල ගාස්තු.**

-------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ජල ව්‍යාපෘති අක්‍රීය වීම නිසා, ප්‍රදේශ 09 ක ජලය බිල් කිරීම අත්හිටුවා තිබූ අතර, එම ප්‍රදේශවලින් වර්ෂ කීපයක සිට අය වියයුතු රු.73,159 ක මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මල්වත්ගම හා ලැන්ටන්හිල් හී ජල සම්බන්ධතා 97 කින් 12 කට පමණක් ජල මනු සවි කර තිබුණි. ඉතිරි සියලුම ජල සම්බන්ධතාවලින් ජල මනු සවි කිරීමකින් තොරව ස්ථාවර ගාස්තුවක් අය කර තිබූ අතර, මෙම සියලු ජල පාරිභෝගිකයින්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට රු.179,248 ක ජල ගාස්තු හිගව පැවතුණි.

**2.2.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු.**

--------------------------------

2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.213,168 ක් හා මුද්දර ගාස්තු රු.10,000,000 ක් ලැබිය යුතුව පැවතුණි. මෙම මුදල්වලින් තවදුරටත් ලැබිය යුත්තේ උසාවි දඩ රු.27,166 ක් හා මුද්දර ගාස්තු රු.3,285,630 ක් බව ලේකම්වරයා 2016 ජුලි 20 දාතමින් මා වෙත වාර්තා කර තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-------------------------------------

(අ) 2015 වාර්ෂික අයවැය යෝජනා යටතේ දුගී ජනයාට සහන සැළසීම වෙනුවෙන් 607(5) වැය විෂයය යටතේ රු.250,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ නමුත්, අදාළ වර්ෂය තුළ එම කාර්යය ඉටු නොකර, එම ප්‍රතිපාදන මුදල ණයහිමියන් යටතේ දක්වා තිබුණි. පසුව එම ප්‍රතිපාදන භාවිතා කර 2016 මාර්තු 21 දින රු.87,500 ක් වටිනා පාසැල් ගමන් මලු 125 ක් ලබා ගෙන තිබුණත්, 2016 ජූනි 15 දින වන විටත් එකී ගමන් මලු බෙදා නොහැර ගබඩාවේ තබා තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට සභාවේ විවිධ තනතුරුවල පුරප්පාඩු 10 ක් හා අතිරික්ත තනතුරු 06 ක් පැවතුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**-------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 21 වගන්තිය ප්‍රකාරව සැළසුම් අනුමත කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 02 ක් තුළ ලැබී තිබුණු ගොඩනැගිලි අයදුම්පත් 284 කින් අයදුම්පත් 176 ක් සඳහා අනුමැතිය ලබා දී තිබුණු නමුත්, අනුකූලතා සහතික නිකුත් කර තිබුණේ ඉන් අයදුම්පත් 24 ක් සඳහා පමණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ දී අනවසර ඉදි කිරීම් 26 ක් අනාවරණය කර ගෙන තිබුණද ඒ සම්බන්ධව කිසිදු නීතිමය හෝ සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභා පැරණි කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි ගබඩාව තුළ ඉවත් කරන ලද අබලි ද්‍රව්‍ය තැන තැන ගොඩ ගසා දිරා පත් වීමට ඉඩ හැර තිබුණු බව 2016 ජූනි 14 දින කරන ලද භෞතික පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. එසේම, ගබඩා ද්‍රව්‍ය පහසුවෙන් හඳුනා ගත හැකි වන පරිදි වර්ග කර නොතිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය.**

**-------------------------**

**3.3.1 ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල වටා ආරක්ෂක බැම්ම සහ ඉතිරි කොටසට ග්‍රීන් ගේට් දැළක් සවි කිරීම - රු.1,598,721**

**-------------------------------------------------------------------------------------**

මෙම කර්මාන්තය සම්බන්ධයෙන් 2016 ජූනි 15 දින කරන ලද භෞතික බරික්ෂාවේදී පහත කරුණු අණාවරණය විය.

(අ) බැම්මේ අවසාන කොටසේ මී.3.8 ක් දුරින් බැම්ම ඉහළ සිට පහළට පුපුරා බැම්මේ කොටසක් පහත් වී තිබූ අතර, එම බැම්ම මතු පිට ඉදි කර තිබුණු එක් කුළුණක් ගැල වී තිබුණි. එසේම, බැම්මේ ආරම්භක කොටසේ ද එක් ස්ථානයක් පුපුරා ගොස් තිබුණි.

(ආ) වැඩ විෂය අංක 02 ට අනුව, 1:3:6(1 ½ ) " කොන්ක්‍රීට් මිශ්‍රණයක් යොදා මීටර් 0.22ක් ඝනකමට ආරක්ෂිත බැම්මේ පතුළ කොන්ක්‍රීට් කළයුතු වුවත්, භෞතික පරීක්ෂණයට අනුව, එහි පතුලේ කොන්ක්‍රීටයේ ඝනකම මීටර් 0.1 ක් වූ අතර, එකී කොන්ක්‍රීටයට පහසුවෙන් කැඩිය හැකි දුර්වල මිශ්‍රණයක් යොදා තිබුණි.

(ඇ) කාර්මික නිලධාරී විසින් පිළියෙළ කළ ඇස්තමේන්තුවේ මිල ගණන්වලට අනුව ඉදි කිරීම් සඳහා ගිවිසුම්ගත වී වැඩ අවසන් කිරීමෙන් පසුව ඇස්තමේන්තුගත රේටයන්ට වඩා වැඩි රේටයන් දක්වමින් ගෙවීම් කිරීම හේතුවෙන්, වැඩ විෂයය 03 ක් සඳහා රු.160,945 ක් වැඩි පුර ගෙවා තිබුණි.

(ඈ) ඉහත ආරක්ෂිත බැම්මේ අත්තිවාරම් කැපීමේ කටයුතු සඳහා සභාවේ කම්කරුවෙකු දින 04 ක් යොදවා තිබූ නමුත්, කර්මාන්තයට අදාළ බිල්පතේ වැඩ විෂය අංක 01 ට අනුව, ඝන මීටර් 25 ක් සඳහා රු.22,417 ක් කොන්ත්‍රාත්කාර සමිතියට ගෙවා තිබුණි.

### 3.3.2 යටිතල පහසුකම් වැඩිදියුණු කිරිම

පළාත් පාලන යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ පුද්ගලික ඉදි කිරීම් සමාගම සමග 2010 වර්ෂයේ ගිවිසුම්ගතව අළුගොල්ල සුසාන භූමිය මාර්ගය, වල්ලහගොඩ උඩගම මාර්ගය හා කරගල වවුල්ලන යන මාර්ග ඉදි කිරීම් සිදු කර තිබුණි නමුත්, එම මාර්ගවල ඉදි කිරීමේ ප්‍රමිතිය දුර්වලව පැවතියෙන්, කෙටි කාලයක් තුළ එකී මාර්ග අබලන් වී තිබුණි.

මෙම ව්‍යාපෘතිවලට අදාළ මුදලින් සියයට 35 ක් වූ රු.2,425,894 ක් තැන්පත් ගිණුමේ රඳවා තිබූ අතර, එම මුදල් යොදවා ඉහත මාර්ගවල අඩුපාඩු සකස් කිරීමට 2015 අප්‍රේල් 27 දිනැති මහා සභාවේ දී තීරණය කර තිබූ නමුත්, 2016 ජුනි 15 දින වන විටත් එකී කාර්යයන් ඉටු කිරීමට කටයුතු කර නොතිබුණි.

### 3.3.3 උඩගම බෝධිය අසළ සිට කොහොවල පන්සල දක්වා පඩි පෙළ සංවර්ධනය කිරීම - රු.156,039

මෙම කර්මාන්තය සම්බන්ධයෙන් 2016 ජුනි 15 දින කරන ලද භෞතික පරිෂණයෙන් පහත කරුණු අණාවරණය විය.

ඇස්තමේන්තුවට අනුව, 1:2.4 ( ¾ )" කොන්ක්‍රීට් මිශ්‍රණයෙන් 4" ක් ඝනකමට කොන්ක්‍රීට් මාර්ග තලය හා පඩි පෙළ ඉදි කළයුතු වුවත්, එහි ස්ථාන කීපයක් කඩා පරීක්ෂා කිරීමේ දී, එක් ස්ථානයක ඝනකම 1 ½ " ක් බව නිරීක්ෂණය විය. එසේම, මාර්ග තලය හා පඩි පෙල සඳහා යොදා ඇති කොන්ක්‍රීටය පහසුවෙන් කැඩිය හැකි ඉතා දුර්වල තත්ත්වයෙන් පැවතුණි.

### 3.3.4 අළුගොල්ල පාර පැති බැම්ම සංවර්ධනය කිරීම - 98,780

ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 06 ට අනුව, බදාම මිශ්‍රණය 1:5 ක් හා වැඩ විෂය අංක 08 ට අනුව කපරාරු මිශ්‍රණය 1:3 ක් ලෙස ඇස්තමේන්තු කර, ඒ වෙනුවෙන් රු.31,825 ක් ගෙවා ඇතත්, කපරාරුව ඉතා පහසුවෙන් අතින් කැඩිය හැකි මට්ටමේ දුර්වල සිමෙන්ති හා වැලි මිශ්‍රණයක් යොදා ඉදි කිරීම් කර තිබුණි.

### 3.4 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය.

සභා බල ප්‍රදේශය තුළ දෛනිකව එකතු වන ඝණ අපද්‍රව්‍ය සහ කුරුදුවත්ත නගරයෙන් එකතු වන කසළ තෝරා, දිරන කසළ කුරුදුවත්ත පිහිටි ජීව වායු ඒකකය සඳහා යොදවා තිබුණි. ඉතිරි සියලු කසළ කළමනාකරණයකින් තොරව උලපනේ හා දොළොස්බාගේ කසළ බැහැර කිරීමේ ස්ථානයන්ට බැහැර කරන බව 2016 ජුනි 15 දින කරණ ලද භෞතික පරික්ෂාවේදී දක්නට ලැබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ දී, ආදායම් හා වියදම් විෂයයන් අතර ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුව ද, අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර ආදායම් විෂයයන් 18 ක සියයට 20 සිට සියයට 95 දක්වා ද, වියදම් විෂයයන් 42 ක සියයට 20 සිට සියයට 97 දක්වා ද, සැළකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණුණි.

(ආ) වැය විෂයයන් 12 ක් සඳහා අයවැයගත ප්‍රතිපාදන රු.666,000 ක් සම්පූර්ණයෙන් ඉතිරි කර තිබූ අතර, ආදායම් විෂයයන් 05 ක් සඳහා අයවැයගත ආදායම් රු.606,800 කින් කිසිදු ආදායමක් උපයා ගෙන නොතිබුණි.

**4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්ම.**

**------------------------------**

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

**4.3 වත්කම් කළමනාකරණය.**

**---------------------------**

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.**

**---------------------------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රු.25,582,326 ක් වටිනා වාහන, යන්ත්‍ර හා උපකරණ අයිතම 10 ක් වර්ෂ 01 ට වැඩි කාලයක සිට නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) මහල් දෙකකින් යුත් පැරණි ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ උපයෝජනයට නොගත් වර්ග අඩි 4750 ක ප්‍රමාණයක් වූ ඉඩකඩ සුදුසු කටයුත්තක් සඳහා යොදා නොගෙන වර්ෂයක පමණ කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

**5. පද්ධති හා පාලනය.**

**--------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ආදායම් පරිපාලනය
(ආ) ණයගැති/ණයහිමි පාලනය
(ඇ) වත්කම් කළමනකරණය
(ඈ) තොග පාලනය
(ඉ) කොන්ත්‍රාත් පාලනය